# විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව

# මොනරාගල ප්‍රාදේශීය සභාව

**මෙහෙයවීම** - මොනරාගල ප්‍රාදේශීය සභාව

**දිනය** - 2022 . 09 . 29

**ස්ථානය** - මොනරාගල ප්‍රාදේශීය සභා ශ්‍රවනාගාරය

**වේලාව** - පෙ.ව. 09.30

**සහභාගීත්වය -**

1. සභා ලේකම්, ඩී.එම්.අනුර දිසානායක මහතා, ප්‍රාදේශීය සභාව, මොනරාගල.
2. ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි, ඒ.එම්.සුගතදාස මහතා, සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය, මොනරාගල.
3. මොනරාගල ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කළමනාකරණ සේවා නිළධාරීතුමිය ඇතුළු අංශ ප්‍රධානීන් , විෂය නිළධාරීන්, කාර්මික නිලධාරි, ආදායම් පරික්ෂක.

**සහභාගී නොවීම -**

1. ඌව පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, ඌව පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව, බදුල්ල.
2. විගණන අධිකාරී, ජාතික විගණන කාර්යාලය, මොනරාගල.

**පිළිගැනීම**

මොනරාගල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ තෙවන කාර්තුව වෙනුවෙන් පවත්වනු ලබන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම සාර්ථක කර ගැනීම සඳහා අද දින පැමිණි සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී පවතින කාර්ය බහුලත්වය මත වුවද අප ආයතනය වෙනුවෙන් ගෞරවයෙන් පිළිගන්නා අතර, ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරීතුමිය ඇතුළු කාර්යාලීය නිළධාරීන් ද සභා ලේකම්තුමා විසින් සාදරයෙන් පිළි ගන්නා ලදී.

**අරමුණු පැහැදිලි කිරීම**

විගණන හා කළමනාකරණ කමිටුව කාර්තුවකට වරක් පැවැත්වීම හා ඒ වෙනුවෙන් සක්‍රීය මැදිහත්වීමක් අනුව කටයුතු කිරීම නිර්ණායකයක් වන්නේය. ඒ අනුව අප ආයතනය විසින් අඛණ්ඩව මෙම කමිටුව පවත්වමින් ආයතනයේ ගැටළු හා අඩුපාඩු රාශියක් නිරවුල් කර ගැනීමට හැකි වූ බව පෙන්වා දෙන ලදී. මේ දින වල පවතින කාර්ය බහුලත්වය මත අද දින මෙම කමිටුව සඳහා අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂතුමාට හා විගණන අධිකාරීතුමියට සහභාගී වීමට නොහැකි බව දන්වා ඇති බව පවසන ලදී. නමුත් විගණන හා කළමනාකරණ කමිටුව අඛණ්ඩව කාර්තුමය වශයෙන් පැවැත්විය යුතු නිසා අද දින මෙම කමිටුව පැවැත්වීමට කටයුතු කළ බව සඳහන් කරන ලදී.

පෙර කමිටුවේදී සාකච්ඡා කළ කරුණු හා ගත් තීරණ

| අනු අංකය | සාකච්ඡා කළ කරුණු | ගත් තීරණ | වගකීම |
|---|---|---|---|
| 01 | **අනුමත කාර්ය මණ්ඩල තනතුරු වල ඌණතා හා අතිරික්තය** අනුමත කාර්ය මණ්ඩල වාර්තාවට අනුව පුරප්පාඩුව පවතින පුස්තකාලයාධිපති I ශ්‍රේණියේ 01 නිළධරයකුත්, කාර්මික නිළධාරි 01 අයෙකුත්, සෞඛ්‍ය කම්කරු 01 අයකුත්, ක්ෂේත්‍ර කම්කරු 01, සෞඛ්‍ය කම්කරු (කොම්පෝස්ට්) 06 දෙනෙකුත්, ගිනිබට ස්ථානභාර නිළධාරි 01 අයෙකුත්, නායක ගිනිබට 01 අයෙකුත්, යාන්ත්‍රික ගිනිබට 03 දෙනෙක් අනුමත කර ගැනීමටත්, අතිරික්තව සිටින ගිනිබට තනතුරු 04 ක් අනුමත කාර්ය මණ්ඩලයට ගලපා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී. | මේ වන විට වියදම් පාලන චක්‍රලේඛ අනුව බඳවා ගැනීම් අත්හිටුවා ඇති නිසා පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කිරීමට නොහැකි බවත්, අතිරික්ත වූ ගිනිබට හා සංවර්ධන නිළධාරී තනතුරු කළමනාකරණය කර ගැනීම සඳහා දෙපාර්තමේන්තු මට්ටමින් තීරණයක් ගත යුතු නිසා සහකාර පළාත් පාලන කොමසාරිස්තුමා මඟින් නැවත දැනුම් දීම සුදුසු බව පවසන ලදී. | විෂයභාර නිළධාරි, වගකිව යුතු අනෙකුත් ආයතන |
| 02 | **අනුමත ගිනිබට තනතුරු වලට අනුගතව නිළධාරීන් පත් කර නොමැති බව** ගිනිබට අංශයේ තනතුරු වලට අදාළව අනුමත කාර්ය මණ්ඩලය අනුව තනතුරෙහි ස්වභාවය හා සේවක සංඛ්‍යාවෙහි නොගැලපීම පිළිබඳව සාකච්ඡාවට බඳුන් කරන ලදී. | තනතුරු වල අසමතුලිත බව ආයතනය විසින් දෙපාර්තමේන්තුව හරහා දැනුවත් කර ඇති බවත් , සහකාර පළාත් පාලන කොමසාරිස්තුමා මැදිහත්වමින් කටයුතු කරන බවත්, ඉදිරියේදි ඒ සම්බන්ධයෙන් විසඳුමක් ලබා දීමට කටයුතු කරන බවත් පවසන ලදී. | විෂයභාර නිළධාරි හා වගකිව යුතු අනෙකුත් ආයතන |
| 03 | **මුර සේවා ස්ථාන වැඩිවීම හා දැනට සිටින අනුමත රියදුරන් ප්‍රමාණයට වඩා ආයතනය සතු වාහන පැවතීම හේතුවෙන් තනතුරු පුරප්පාඩු වී පැවතීම.** ආයතනය සතු වාහන 15ක් පවතින අතර දැනට රියදුරන් 06 දෙනෙකු ස්ථිරව සිටින අතර, රියදුරන් 09 දෙනෙකු ඌණව පැවතීමත්, දිවා රාත්‍රි ලෙස මුර ස්ථාන 10ක සේවය කිරීමට මුරකරුවන් 10 දෙනෙකු සිටින අතර 07 දෙනෙකු ඌණ වන | අනුමත කාර්ය මණ්ඩලය අනුව ආයතනය තුල පවතින තනතුරු පුරප්පාඩු හා අතිරික්තයන් සෑම පලාත් පාලන ආයතනයකටම බලපා ඇති බැවින් දෙපාර්තමේන්තු | විෂය භාර නිළධාරි හා වගකිව යුතු ආයතන |

| | | | |
|---|---|---|---|
| | අතර ,රියදුරන් හා මුරකරුවන් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා සිටින ලදි. | මට්ටමින් විසඳුමක් ලබා ගැනිම සුදුසු බව සඳහන් කරන ලදී. | |
| 04 | **HSR/ BSR/ ISR යන අනුමත මිල ගණන් යටතේ ඉදිකිරීම් සිදු කිරිමට පවතින අපහසුතා.**<br><br>ඉදිකිරීම් ද්‍රව්‍ය වල මිල වර්තමානයේ වෙළෙඳපොළ තුළ පවතින මිල උච්චාවචනය හේතුවෙන් HSR/ BSR/ ISR යන අනුමත මිල ගණන් යටතේ ඉදිකිරීම් සිදු කිරිමට අපහසුතාවයන් පවතින බැවින් ඒ සඳහා උපදෙස් ලබා දෙන ලෙස සඳහන් කරන ලදී. | මිල සංශෝධනය කිරීමට නොහැකි බවත්, ඇස්තමේන්තු සකස් කිරීමේදී පවතින මිල ගණන් හා වැඩ නිම කිරීමෙන් පසු බිල්පත් ඉදිරිපත් කිරිම පදනම් කර ගෙන වර්තමාන මිල ගණන් අනුව ප්‍රධාන ලේකම්තුමා හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් මැදිහත් වීමෙන් සාධාරණව ගෙවීම් කිරීමට අනුමැතිය ලබා දෙන බව සඳහන් කරන ලදී. | විෂය නිළධාරීන් හා කාර්මික නිළධාරි |
| 05 | **ප්‍රාදේශීය සභා ඉඩම් නිරවුල් කර ගැනීම.**<br>ප්‍රාදේශීය සභාව සතු ඉඩම් 11ක් නිරවුල් කිරීම සඳහා 2017 – 2018 වර්ෂයන්හිදී මුදල් ගෙවීම් සිදු කළ ද මේ වනවිට එක් ඉඩමක් මැන නිරවුල් වීමත්, අනෙක් ඉඩම් සඳහා මේ වනවිට කිහිප වතාවක් දැනුවත් කිරීම් කලද මැන වෙන් කිරීම් සිදුවී නොමැති බවත්, මෙම ඉඩම් කඩිනමින් නිරවුල් කරගැනීමට අවශ්‍ය වී ඇත. ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙන මෙන් ඉල්ලා සිටින ලදී. | රජයේ වත්කම් ගිණුම් ගත කිරීමේ අවශ්‍යතාවය පෙරදැරි කර ගනිමින් පිළිගත් තක්සේරුවක් අවශ්‍ය වුවත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කළ ද මේ වන තෙක් ස්ථිර තක්සේරුවක් කිරීමට තක්සේරු නිලධාරීන්ගේ සේවය ලබා ගැනීමට නොහැකි වී ඇත. පළාත් ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මඟින් තක්සේරුකරණය පිළිබඳ උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු කිරීමට තීරණය කරන ලදී. | විෂය නිළධාරීන් හා කාර්මික නිළධාරි හා වගකිව යුතු ආයතන |
| 06 | **2022 වර්ෂයේ අයවැය අනුව ක්‍රියාත්මක වීමේ දී වර්තමාන මිල උච්චාවචනය හේතුවෙන් වියදම් පාලනය කිරිමට අපහසුතා ඇතිවිම.**<br>වර්තමානයේ භාණ්ඩ වල පවතින වෙළඳපොළ මිල ගණන් ඉතා ශීඝ්‍රයෙන් ඉහළ යාමත්, පවතින දුෂ්කරතා හා ප්‍රායෝගිකව බලපා | විෂයභාර නිළධාරීන් විසින් මහ සභාවේ අනුමැතීන් අනුව ඉදිරි කටයුතු සිදු කරන බව සඳහන් කරන | විෂය නිළධාරි |

| | | | |
|---|---|---|---|
| | ඇති කරුණු අනුව මහජනතාව විසින් නිසි ලෙස බදු ආදායම් ලබා නොදීමත් යන කරුණු පළාත් පාලන ආයතන වල සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරිමේදී සෘජුවම බලපාන බවත්, 2022 වර්ෂයට සකස් කළ අයවැය ලේඛණයේ එක් එක් වියදම් ශීර්ෂයන් සඳහා වෙන් කළ ඇති ප්‍රතිපාදන ඉහත තත්ත්වයන් මත වසර පුරාවටම අදාළ කර ගැනීමට නොහැකි තත්ත්වයක පවතින බැවින් ඉදිරියේදී කටයුතු කිරීමේ දී පවතින තත්ත්වය පිළිබඳ කරුණු විමසන ලදී. | ලදී. | |
| 07 | **කෝවිඩ් මෘත දේහයක් වෙනුවෙන් ප්‍රතිපූර්ණය වන මුදල් ප්‍රමාණය වියදමට සාපේක්ෂව ප්‍රමාණවත් නොවීම**<br>වෙළෙඳපොළේ පවතින ගෑස් වල මිල ගණන් වැඩි වීමත් , ගෑස් ටැංකි නිසි කලට සපයා ගැනීමට නොහැකි වීමත් මත ආදාහන කටයුතු සිදු කරන බව හා කෝවිඩ් මෘතදේහයක් වෙනුවෙන් රු.10,000.00කට වඩා වැඩි වියදමක් දැරීමට සිදුවීමත් ඒ සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් රු.5,000.00ක මුදලක් ප්‍රතිපූර්ණය කරන අතර එම මුදල එක් කෝවිඩ් මෘතදේහයක් සඳහා ප්‍රමාණවත් නොවන බවත් සාකච්ඡා කරන ලදී. | පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිපූර්ණය කරනු ලබන රු.5000.00 ක මුදල වැඩි කිරිම සඳහා ඉල්ලුම් කළද මේ වන විට එයද සාර්ථක නොවීම හේතුවෙන් ජුනි මාසයේ දී පැවති මහ සභාවේදී ආදාහනාගාර ගාස්තු වැඩි කරමින් පැවති වියදම් තත්ත්වය අවම කර ගැනීමට කටයුතු කළ බව පවසන ලදී. | විෂය භාර නිළධාරි හා අදාළ වගකිව යුතු ආයතන |
| 08 | **ප්‍රවර්තන වර්ෂය සඳහා ආදායම් අය කර ගැනීම් සඳහා ගැසට් කිරීමෙන් අනතුරුව සාධාරණ හේතු මත ආදායම් වැඩි කිරීම් සඳහා අය කර ගැනීමේ ක්‍රමවේදය**<br>ඉන්ධන මිල ගණන් දිනෙන් දින ඉහල යාම හා ප්‍රමාණවත් පරිදි සොයා ගැනීමට නොහැකි වීම මත ආයතනය සතු බර වාහන යන්ත්‍ර වලින් ඉටු කරන සේවාවන් සඳහා අය කරන ගාස්තුව යම් ප්‍රතිශතයකින් වැඩි කිරීමට මහ සභාව තීරණය කර ඇත. මෙහිදි වර්ෂයට අය කළ යුතු බදු හා ගාස්තු සම්බන්ධව ගැසට් කිරීමෙන් පසු මෙම වැඩි කිරීම් සම්බන්ධ තීරණ ගෙන ඇති බවත්, එම ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් නීතිමය තත්ත්වයන් පිළිබඳව විමසන ලදී. | පෙර කමිටුවේ දී දැනුම් දුන් පරිදි නිවැරදි ක්‍රමවේදය අනුගමනය කරන බව පවසන ලදී . | විෂයභාර නිළධාරි |

| | | | |
|---|---|---|---|
| 09 | **හිඟ ආදායම් අයකර ගැනීම පිළිබඳව පවතින තත්ත්වය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂතුමා විසින් විමසීම් කරන ලදී.**<br><br>සභා ලේකම්තුමා ඇතුළු නිලධාරීන් විසින් පෙන්වා දෙනු ලැබුයේ රට තුළ පැවති කොරෝනා වසංගත රෝගී තත්ත්වය හා සෞඛ්‍ය උපදෙස් අනුගමනය කරමින් කටයුතු කළ යුතු බවත්, සංචරණ සීමා පනවා රට වසා තැබූ කාලය තුළ වෙළෙඳුන්ගේ ඉල්ලීම මත සහන ලබා දීමට සිදු වූ බවත් එම බදු මුදල් කපා හැරීම් මේ වනවිටත් ආණ්ඩුකාරතුමා වෙත යොමු කර ඇති අතර ඒ සම්බන්ධයෙන් මහ සභා අනුමැතීන් ලබා ඇති බවත්, වරිපනම් හිඟ සම්බන්ධ හිඟයන් අයකර ගැනීම සඳහා දේපළ තහනමට ගැනීම් වැනි ක්‍රියාකාරකම් වලට මෙම අවස්ථාවේ යොමු නොවන බවත් මහ සභාව ලබාදුන් උපදෙස් අනුව කටයුතු කිරීමට සිදු වූ බවත්, ඒ අනුව අපේක්ෂිත ආදායම සැලසුම් කළ පරිදි අය කර ගැනීමට අපහසු වූ බවත් පවසන ලදි. එහෙත් විගණනය විසින් පෙන්වා දෙන ලද තත්ත්වයන් සැලකිල්ලට ගෙන විගණිත දිනය වන විටත් පැවති රු.10,000.00 ඉක්ම වූ වරිපනම් ඒකක 254කින් මේවනවිට විශාල ප්‍රමාණයක් අඩු කර ගැනීමට මැදිහත් වී කටයුතු කර ඇති බවත්, ඉදිරියේදී ද දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත දැනුම් දී රජයේ දේපළ වල හිඟ වරිපනම් බදු අයකර ගැනීමට සැලසුම් සකස් කර ඇති බවත් සඳහන් කරන ලදී. | හිඟ ආදායම් අය කර ගැනීම සඳහා ජංගම සේවාවන් පැවැත්වූ බවත් එයින් සැලකිය යුතු ප්‍රමාණයකින් හිඟ ආදායම් අය කර ගැනීමට හැකි වූ බව පවසන ලදී. එමෙන්ම 2023 වර්ෂය සඳහා වරිපනම් බදු අය කිරීම වෙනුවෙන් K පෝරම් මේවන විට සකස් කරමින් පවතින බවත්, වර්ෂය ආරම්භ වීමට පෙර K පෝරම් නිකුත් කිරීමට හැකි බව හා නැවත හිඟ නිවේදන ද ඒ සමඟ යොමු කරන බව පවසන ලදී. එමෙන්ම ආදායම් පරීක්ෂකවරුන් මීට වඩා මැදිහත්වී ආදායම් අය කර ගැනීමට පියවර ගැනීම සුදුසු බවද දන්වන ලදි. | විෂයභාර නිලධාරි, ආදායම් පරීක්ෂක |
| 10 | **විථීපහන් නඩත්තුව සම්බන්ධව**<br>මුළු රට තුළම දෛනිකව විදුලි කප්පාදුවක් සිදු කරන අවස්ථාවේ දී විථීපහන් සම්බන්ධයෙන් ද ලැබී ඇති උපදෙස් අනුව පළාත් පාලන ආයතන ක්‍රියාත්මක වීම පිළිබඳව අදහස් විමසන ලදී. | නගර සීමාව තුළ හා නගර සීමාවෙන් පිටත මනා පාලනයකින් යුතුව විථීපහන් නඩත්තුව සිදු කරන බව සඳහන් කරන ලදී. | විෂයභාර නිලධාරි, විදුලි අංශයේ සේවකයින් |

| | | | |
|---|---|---|---|
| 11 | **<u>අවසන් ගිණුමෙහි සම්පිණ්ඩන වාර්තාව පිළිබඳව සාකච්ඡා කිරීම</u>**<br>**ගිණුම් කරන දෝෂයන්**<br>• ඉඩම් තක්සේරුව ද්විගණ වී ඇති බව සාකච්ඡා කරන ලදී.<br>• පෙර වර්ෂයේ ඉදිකරනු ලැබූ ගොඩනැගිලි 08 ක් ගිණුම් ගත නොකිරීම/ ආදාහනාගාරයේ ආදායම් වලින් රු.60,000.00 ක ආදායමක් පෙන්වා නොමැති බව<br>• නවබස්නැවතුම්පළෙහි කඩකාමර 33න් 03ක් ගිවිසුම් ගත නොවීම පිළිබඳව සාකච්ඡාවට බඳුන් කිරීම<br>• ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර ඇති සමහර භාණ්ඩයන් ඉන්වෙන්ට්‍රි ලේඛනයේ භාණ්ඩයන් සමඟ නොසැසදීම. | මෙම ගිණුම් කරන දෝෂයන් නිවැරදි කර ගැනීම සඳහා පෙර කමිටුවේදී ලබා දුන් උපදෙස් හා විසඳුම් අනුව කටයුතු කරන බව සඳහන් කරන ලදි. | විෂයභාර නිළධාරින් |
| | • ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමෙන් අනතුරුව අදාල ඉදිකිරීම් පරීක්ෂා කර අනුකූලතා සහතික 200ක් නිකුත් නොකිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම. | මේ වනවිට අනුකූලතා සහතික කල් පිරුණු පුද්ගලයින් වෙත තම ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමෙන් අනතුරුව අනුකූලතා සහතිකය ලබා ගන්නා ලෙස දැනුවත් කිරීමේ ලිපි මේ වන විට නිකුත් කර ඇති බව පවසන ලදී. | විෂයභාරනිළධාරි, කාර්මික නිළධාරින් |
| | • විගණන විමසුම් මඟින් ප්‍රාදේශීය සභාව විසින් පවත්වා ගෙන යනු ලබන වීථි ආලෝක කරණය සඳහා වීථි පහන් සවි කර ඇති බවත් ඒ සඳහා විදුලි බල මණ්ඩලය සමඟ ගිවිසුම් | විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම් ගත වීම අවාසිදායක තත්ත්වයක් බව පෙන්වීම හා පොදු මහජන අවශ්‍යතාවයන් සපුරාලිය යුතු බවත් දන්වා මේ සම්බන්ධයෙන් | මහ සභාව, විෂයභාර නිළධාරි,කාර්මික නිළධාරි |

| | | | |
|---|---|---|---|
| | ගත වී නොතිබීම සම්බන්ධව පෙන්වා දී ඇති කරුණු පිළිබඳව විමසීම. | විසඳුමක් ලබා දෙන ලෙස සාධාරණීකරණ වාර්තාවක් දෙපාර්තමේන්තුව හරහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කරන බව පවසන ලදී. | |
| | • මොනරාගල නව පොළ භූමිය ඉදිකිරිම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් එකඟතාවයක් ලබා දෙන ලදී. ඒ අනුව UNDP සහ NELSHIP විදේශාධාර මත පොළ භූමියේ ඉදිකිරීම් කටයුතු සිදු කරන ලදි. නමුත් දැනට මෙම ස්ථානයට අදාළව තක්සේරුවක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඉල්ලා ඇති අතර, එම බදු වලින් නිදහස් කර ගැනීමට හැකියාවක් පවතී දැයි විමසන ලදි. | පෙර කමිටුවේදී ලබා දුන් තීරණය අනුව කටයුතු කරන ලෙසත්, ජනවසම සමඟ සාකච්ඡා කර ඔවුන් ලබා දෙන නිර්දේශ ද අනුව ඉදිරි කටයුතු කිරිම සඳහා මැදිහත්ව කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදී. | මහ සභාව , ජනවසම, ඉඩම් ප්‍රතිසංස් කරණ කොමිෂන් සභාව, පළාත් පාලන කොමසාරිස් |
| | • ගව මස්කඩය සම්බන්ධයෙන් ගෙවීමට ඇති හිඟ මුදල් අය කර ගැනීම වෙනුවෙන් අධිහාර වශයෙන් එවකට සිටි සභාපති හා ලේකම් සඳහා ඔවුන් නමින්ම ගෙවීමට නියම කර අධිහාර නිකුත් කර තිබුණද මේ වන විට එම දෙපළ ම ජීවතුන් අතර නොමැති නිසා ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමේ ගැටළුවක් පවතින බව පෙන්වා දෙන ලදී. | අධිහාර අය කර ගන්නා පාර්ශවයන් මේ වන විට ජීවතුන් අතර නොමැති නිසා අය කර ගැනීමට නොහැකි වීම මත කඩ කුලී ලේඛන වලින් කපා හැරීම සඳහා දෙපාර්තමේන්තු මට්ටමින් ඉල්ලම් කිරිමට කටයුතු කරන බව සඳහන් කරන ලදි. | පළාත් පාලන කොමසාරිස්, මහ සභාව, විෂය භාර නිළධාරී |
| 02 | **අනුමත වියදම් සීමාවන් ප්‍රමාණවත් නොවීම**<br><br>වාහන අළුත්වැඩියාවන් සිදු කිරීමේදී දෙපාර්තමේන්තුව මඟින් අනුමත කර ගත යුතු සීමාවන් හා වගකිව යුතු නිර්දේශයන් සමඟ අනුමත | මේ පිළිබඳව නෛතිකො හා ප්‍රායෝගික තත්ත්වයන් පළාත් පාලන | විෂය භාර නිළධාරී |

| | | | |
|---|---|---|---|
| | කරගත යුතු සීමාවන් සලකා බලා අළුත්වැඩියා කිරිමට පෙර නියමිත අනුමැතියන් සිදු කර ගැනීමට කටයුතු කළ යුතු අතර, වර්තමාන වෙළෙඳපොළෙහි පවතින භාණ්ඩයන්හි මිල අධික ලෙස ඉහල යාම දක්නට ලැබෙන නිසා මෙම අනුමත සීමාවන් දැනට සුළු අළුත්වැඩියාවන් සඳහා ද යන වියදම හා සැසඳෙන බව සඳහන් කරන ලදී. එම නිසා දැනට පවතින අනුමත මුල්‍ය සීමාවන් ප්‍රායෝගික නොවන බව පෙන්වා දෙමින් ඒ සඳහා ගත හැකි ක්‍රියාමාර්ග මොනවා දැයි විමසන ලදි. | දෙපාර්තමේන්තුව වෙත යොමු කර අවශ්‍ය නිර්දේශ ලබා ගන්නා ලෙස දන්වන ලදී. | |
| 03 | **නියෝජිත ආයතන මඟින් ඉදිරිපත් කරනු ලබන ඇස්තමේන්තු අනුමත කර ගැනීම**<br><br>වාහන අළුත්වැඩියා සිදු කිරීමේදී නියෝජිත ආයතනය මඟින් ඉදිරිපත් කරනු ලබන ඇස්තමේන්තුව පලාත් පාලන අමාත්‍යාංශය මඟින් අනුමැතියක් ලබා ගැනීම අවශ්‍යය. නමුත් මෙම අනුමැතිය ලැබීම ප්‍රමාද වන නිසා නිසි වේලාවට අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට නොහැකි බව පවසන ලදි. ඒ සඳහා විසඳුමක් ලබා දෙන මෙන් ඉල්ලීම් කරන ලදී. | අදාළ කාර්යයන් විනිවිධභාවයකින් හා විදිමත්ව සිදු කළයුතුව ඇති බැවින් මෙම ක්‍රියාවලිය එලෙසින්ම අනුගමනය කරන ලෙසත් තාක්ෂණික මෙවලම් භාවිතයෙන් මෙය කඩිනම් කර ගැනීමට මැදිහත් වන ගෙස දැනුම් දෙන ලදි. | විෂය භාර නිළධාරි |
| 04 | **රැකියා ලක්ෂයේ නිළධාරීන් සඳහා නිවාඩු දිනයක් ලබා දීම**<br><br>මෙම සේවකයින් සති අන්ත නිවාඩු දින වලද රාජකාරි සඳහා යොදවා ගැනීම වෙනුවෙන් අමතර නිවාඩුවක් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත. | මෙය ආයතනික වශයෙන් කළමනාකරණය කරගත යුතු කරුණක් බරවින් රාජකාරි වලට බාධාවක් නොවන අයුරින් ගැලපීම් කර අවශ්‍ය නිවාඩු ලබා දීම සුදුසු බවත් දැනුම් දෙන ලදී.මේ වන විට මෙම තත්ත්වය නිරවුල් කර ගෙන ඇත. | විෂය භාර නිළධාරි |
| 05 | **වාහන පිරිවැය වාර්තාවක් පිළිසකර කර ගැනීම**<br><br>ආයතනය සතු සියළුම වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා ලොග් සටහන් පොත හා සමානවම වාහන | මෙම ලේඛනය පරිගණක ගත කරමින් සකස් කරන බව පවසන ලදී. | විෂය භාර නිළධාරි |

| | | | |
|---|---|---|---|
| | ඉතිහාසය හා වර්තමානයේ සිදු කරනු ලබන අළුත්වැඩියාවන් හා වාහනයේ තත්ත්වය පිළිබඳව සටහන් ඇතුලත් කරනු ලබන ලේඛණයක් සකස් කිරීමට පියවර ගන්නා මෙන් දන්වන ලදි. | | |
| 06 | 2020 වර්ෂයේ දී කෝවිඩ් වසංගත කාලයේදී සභා අරමුදලින් සභාපතිතුමා ඇතුළු සභිකයන් සඳහා අත්තිකාරම් මුදල් ලබා දී ප්‍රදේශයේ මහජනතාව සඳහා සහනදායි ආහාර මළු බෙදා දීමට කටයුතු කරන ලදී. නමුත් එම අත්තිකාරම් මුදල් නැවත පියවීම සභිකවරු දෙදෙනෙකු විසින් අතපසු කර ඇති බවත්, මහ සභා න්‍යාය පත්‍රයට ඇතුළත් කර මහ සභාවේදීද සාකච්ඡා කිරීමේදී ඔවුන් විසින් එම මුදල් ගෙවන බව දන්වා සිටියත් මේ වන තෙක් නොගෙවා සිටින බවත්, මේ සම්බන්ධයෙන් කුමන පියවරක් ගන්නේ දැයි විමසීම් කරන ලදී. | නැවත වරක් මහසභා න්‍යාය පත්‍රයට මෙම කාරණය ඉදිරිපත් කර එහිදි මහ සභා තීරණයක් ලබා ගැනීමට කටයුතු කරන ලෙස සඳහන් කරන ලදී. කෙසේ වෙතත් ලබා ගත් අත්තිකාරම් මුදල් නිසි ලෙස නොපියවීම මත අධිභාරයන්ටද ලක්වීමට ඉඩ ඇති බැවින් අදාළ සභිකවරුන් නැවත දැනුවත් කරන ලෙස දන්වන ලදි. | විෂය භාර නිළධාරි |
| 07 | රාජ්‍ය වියදම් පාලනය සඳහා මුදල් අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව සභා අරමුදල් මඟින් අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු සිදු කිරීමට ද නොහැකිවී ඇති බව දන්වා සිටින ලදී. එමෙන්ම සභා අරමුදල් මඟින් සිදු කිරිමට නියමිත අත්‍යාවශ්‍ය සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරිම සඳහා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කර ගැනීම සඳහා ඉදිරිපත් කළද ඔවුන් විසින් ඒ සඳහා අනුමැතිය ලබා දීමට උත්සාහ නොකරයි. එබැවින් මේ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ගය කුමක් දැයි විමසීම් කරන ලදී. | රාජ්‍ය ප්‍රතිපත්ති මත ගෙන ඇති මෙවැනි තීරණ කෙරෙහි අවධානය යොමු කර කටයුතු කරන ලෙසත් නොවැලැක්විය හැකි කාර්යයන් සඳහා පමණක් නිවැරදි සාධ්‍යතා වාර්තා ලබා ගෙන කොමසාරිස්තුමාගේ අනුමැතීන් ලබා ගැනීමෙන් පසු කටයුතු කිරීම සුදුසු බව දැනුම් දෙන ලදි. | විෂය භාර නිළධාරි |

<u>අද දින සාකච්ඡා කළ කරුණු</u>

**01.ආදායම් පරිපාලනය**

හිඟ ආදායම් අය කර ගැනීම සම්බන්ධයෙන් මේවන විට විවිධ ක්‍රියා මාර්ග ගෙන ඇති අතර දේපළ තහනමට ගැනීමේ ක්‍රියාවලියට මැදිහත්වීම කළ යුතුව ඇත. එහෙත් රටේ පවතින දුෂ්කර වාතාවරණය හමුවේ මේ සඳහා මහ සභාවෙන් එකඟතාවයක් ලබාදීම සිදු නොකළ බැවින් විකල්ප ක්‍රියාමාර්ගය

අනුගමනය කරමින් හිඟ ආදායම් අය කර ගැනිමමට පියවර ගන්නා ලදි. එහිදි රු.10000.00 ඉක්ම වු හිඟ වරිපනම් ඇති දේපළ සඳහා ආදායම් පරීක්ෂකයින්ගේ සෘජු මැදිහත් වීම මත කටයුතු කිරීමට උපදෙස් ලබා දෙන ලදි. තවද ගිවිසුම් කොන්දේසි උල්ලංඝණය කර ඇති බදුකරුවන් සඳහා නිවේදන නිකුත් කර වෙළෙඳසැල් මුද්‍රා තැබීමට ඉදිරියේදී කටයුතු කරන බවද සඳහන් කරන ලදි.

## 02 .අයවැය පාලනය

2022 වර්ෂයේ අයවැය ඉලක්ක වලින් 80% මේ වන විට ඉක්මවලා ඇති බවත්, රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා ජාතික අයවැය චක්‍රලේඛ අංක 3/2022 නිකුත් කිරීම මත අයවැය ඉලක්ක සම්පූර්ණ කිරීම සඳහා යම් බාධාවක් වන බව සඳහන් කරන ලදී.

## 03. අභ්‍යන්තර පාලන ක්‍රමය හා කළමනාකරණ ක්‍රියාවලිය

ආයතනයේ අභ්‍යන්තර කළමනාකරණය හොඳ මට්ටමකින් පවත්වා ගෙන යන ලදී. ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී මඟින් මෙම කටයුතු මනා පාලනයක් අනුව නියාමනය වන අතර, අංශ මට්ටමින් ද අංශයන් තුල නියාමනයක් වන බවද පවසන ලදී. ආයතනය සඳහා පුහුණු වැඩසටහන් සැලැස්මක් නිළධාරීන්ගේ අවශ්‍යතා අනුව සකස් කර ඇත. ඒ අනුව ඔවුන්ගේ ඉල්ලීම් පදනම් කර ගනිමින් CDLG ව්‍යාපෘතිය යටතේ පුහුණුවීම් සිදු කරන ලදී. මෙම වර්ෂයේදී ගිනිබට නිළධාරීන් වෙත නෛතික හා ප්‍රායෝගික පුහුණුවක් අප ආයතනය තුළ දීම පැවැත්වූ බවත්, එවැනි පුහුණු වීම් සංවිධානය කරමින් අත්‍යාවශ්‍ය සහයන් ලබාදීම ආයතනයක් වශයෙන් අප ලද ජයග්‍රහණයක් බව පවසන ලදී. කාර්ය මණ්ඩලය සඳහා සුභසාධන සේවාවන් ඉටු කිරීමට කටයුතු කරන බවත්, ආයතනයේ සේවකයින් සඳහා සේවක ණය ලබා දීම, ප්‍රමාදයකින් තොරව සේවකයින් සඳහා වැටුප් ගෙවීම, ගිනි නිවීමේ සේවාවන් මනා ලෙස පවත්වා ගෙන යාම හා කෝවිඩ් ඒකකය මඟින් දිවා රාත්‍රී සේවාවන් පවත්වා ගෙන යාම සිදු කර ගෙන යන බව පවසන ලදී.

2023 වර්ෂය සඳහා වරිපනම් බදු අය කිරීම වෙනුවෙන් තක්සේරු වරිපනම් නිවේදන (K පෝරම්) මේ වන විට ලියා අත්සන සඳහා යොමු කර ඇති අතර, මෙවරද මෙම නිවේදන ප්‍රමාණවත් කාලයක් ඇතුව නිකුත් කළ හැකි බවද දන්වන ලදී.

ප්‍රදේශයේ පවතින පොදු ගැටළුකාරී තත්ත්වයන් වලදී ආයතනික වශයෙන් දායකත්වයක් ,මැදිහත්වීමක් දැක්විය හැකි අවස්ථා වලදී ලොකු වෙනසක් ඇති කිරීමට හැකි වූ බව පවසන ලදී. මේ දවස් වල රිලවුන්ගෙන් මහජනයා සඳහා කරදර සිදුවන අතර ඒ සඳහා කටයුතු සිදු කළයුතු ආයතන දැනුවත් කිරීමේදී රිලවුන් අල්ලන කුඩු ප්‍රමාණවත් නොවන බව පවසන ලදී. ඒ අනුව අප ආයතනය මැදිහත් වීමෙන් රිලවුන් අල්ලන කුඩු 02ක් සාදා දෙමින් එම ගැටළුව නිරාකරණය කර ගැනීමට මැදිහත්ව කටයුතු කළ බව සඳහන් කරන ලදී.

ආයතනයේ කාර්යයන් හෝ ලිපිලේඛණ ගත කිරීම් සම්බන්ධයෙන් ද තවදුරටත් යම්කිසි ආකාරයකින් පවතින ගිණුම්කරණය සම්බන්ධයෙන්ද ගැටළු නිරාකරණය කර ගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කණ්ඩායම් පරීක්ෂණයක් සිදු කිරීම සඳහා සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත ලිඛිත ඉල්ලීමක් යොමු කිරීමට මේ වනවිට කටයුතු කළ බව සඳහන් කරන ලදී.

## 04. වාර්ෂික ගිණුම ඉදිරිපත් කිරීම

අවසන් ගිණුම සම්බන්ධයෙන් කළමනාකරණ විගණන වාර්තාවේදී පෙන්වා දී තිබූ මෙහෙයුම් අකාර්යක්ෂමතා හා කළමනාකරණ දුර්වලතා පිළිබඳව මීට පෙර පැවති කමිටුවේදී සාකච්ඡා කරන ලදී. එහිදි ලබා දෙන ලද තීරණ සඳහා අවදානය යොමු කර කටයුතු කරන අතර, ස්ථාවර වත්කමක් ලෙස දිස්ත්‍රික් පුස්තකාලය ඇතුළත් කිරිමට කටයුතු නොකර ඇත්තේ 2013 වර්ෂයේදී එම ගොඩනැගිල්ල ඉදිකිරීමෙන් අනතුරුව අප ආයතනය වෙත පවරා දෙන බවට දන්වා තිබීමත් මේවන තෙක් එය පවරා නොදීම හේතුවෙනි. ඒ සම්බන්ධයෙන් ගොඩනැගිල්ල පවරා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇති බවත් එය නිරවුල් කර දීමෙන් අනතුරුව ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුලත් කරන බව සඳහන් කරන ලදී. එමෙන්ම වැලියාය පුස්තකාලය පවතින ඉඩමෙන් පර්චස් 100 ක භූමි ප්‍රමාණයක්

ආයුර්වේදය රෝහල සඳහා ලබා දීමට කටයුතු කරන ලදී. ඒ අනුව ස්ථාවර වත්කම් ලේඛණයෙන් එම කොටස් ඉවත් කිරීමට කටයුතු සිදු කරන ලදී.

**<u>කාර්ය සාධනය පිළිබඳ සමාලෝචනය කිරීම හා රැස්වීම අවසන් කිරීම</u>**

අද දින පැවති මෙම කමිටුවේදී පෙර කමිටුවේදී ඉදිරිපත් කරන ලද කරුණු වල ප්‍රගතිය සාකච්ඡා කළ අතර 2022 වර්ෂයේ පැවැත්වීමට නියමිත සතර වන කාර්තුවේ කමිටු රැස්වීම සාර්ථක අන්දමින් පැවැත්වීමට කටයුතු කරන බව පවසන ලදි. එමෙන්ම LDSP ව්‍යාපෘතියේ කාර්ය සාධන ඇගයීම සඳහා සියළුම නිලධාරීන් උපරිමයෙන් කැපවී ඉහලම ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කරමු යැයි පවසන ලදී. එමෙන්ම අද දින කමිටුව සාර්ථක කර ගැනීම සඳහා පැමිණි සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරීතුමාට හා ආයතනය වෙනුවෙන් නියෝජනය කරනු ලැබූ සියළුම නිළධාරීන් සඳහා ස්තූතිය පුද කරන ලදී.

| අනු අංකය | සාකච්ඡා කළ කරුණු | ගත් තීරණ |
| --- | --- | --- |
| 01 | | හිඟ ආදායම් අය කර ගැනීම සම්බන්ධයෙන් ඍජු තීරණයක් මහ සභාව විසින් ලබා නොදීම මත එයට විසදුමක් වශයෙන්<br><br>කලාප 06 ම ආවරණය වන පරිදි ජංගම සේවා පවත්වා හිඟ ආදායම් වලින් සැලකියයුතු ප්‍රමාණයක් ලබා ගැනීමට හැකි වු බවත් රු.10000.00 ට වැඩි හිඟ පවතින බදුකරුවන් සඳහා වෙනම දැනුම් දී එම හිඟ මුදල් ලබා ගැනීමට කටයුතු කරන ලදී. තවදුරටත් පවතින හිඟ සම්බන්ධයෙන් එම දේපළ සභාව සතු කර ගන්නා බව දැනුවත් කිරීම් සිදු කරන ලදී. |
| 02 | අයවැය පාලනය | අයවැය ඉලක්ක වලින් 80% මේ වන විට ඉක්මවලා ඇති බවත්, ජාතික අයවැය චක්‍රලේඛ අංක 3/2022 මඟින් වියදම් පාලනය කිරීම මත ඉදිරියේදී අය වැය ඉලක්ක සම්පූර්ණ කිරීමට නොහැකිවේ යැයි සඳහන් කරන ලදී. |
| 03 | අභ්‍යන්තර පාලන ක්‍රමය හා කළමනාකරණ ක්‍රියාවලිය | ආයතනයේ අභ්‍යන්තර කළමනාකරණය හොඳ මට්ටමකින් පවත්වා ගෙන යන ලදී. එහිදි |

| | | |
|---|---|---|
| | | ප්‍රධානකළමනාකරණ සේවා නිලධාරීතුමිය හරහා සමස්ථ කාරණා මනා පාලනයක් අනුව නියාමනය වන අතර, අංශ මට්ටමින් ද අංශයන් තුල නියාමනයක් වන බවද පවසන ලදී. ආයතනය සඳහා පුහුණු වැඩසටහන් සැලැස්මක් නිළධාරීන්ගේ අවශ්‍යතා අනුව සකස් කර ඇත. ඒ අනුව ඔවුන්ගේ ඉල්ලීම් පදනම් කර ගනිමින් CLG ව්‍යාපෘතිය යටතේ පුහුණුවීම් සිදු කරන ලදී. එහිදි  මෙම වර්ෂයේදී ගිනිබට නිළධාරීන් වෙත නෛතික හා ප්‍රායෝගික පුහුණුවක් අප ආයතනය තුළ දීම පැවැත්වූ බවත් , ආයතනයක් ලෙස එය ලොකු ජයග්‍රහණයක් බව පවසන ලදී. කාර්ය මණ්ඩලය සඳහා සුභසාධන සේවාවන් ඉටු කිරීමට කටයුතු කරන බවත් ඒ අනුව සේවක ණය ලබා දීම,ප්‍රමාදයකින් තොරව සේවකයින් සඳහා වැටුප්  ගෙවීම, ගිනි නිවීමේ සේවාවන් මනා ලෙස පවත්වා ගෙන යාම හා කෝවිඩ් ඒකකය මඟින් දිවා රාත්‍රී සේවාවන් පවත්වා ගෙන යාම සිදු කර ගෙන යන බව පවසන ලදී.<br>2023 වර්ෂය සඳහා වරිපනම් බදු අය කිරීම |

| | | |
|---|---|---|
| | | වෙනුවෙන් K පෝරම් මේ වන විට ලියා අත්සන සඳහා යොමු කර ඇති අතර, මෙම වර්ෂයේ දීම නිකුත් කිරීමට හැකි බව පවසන ලදී.<br>ප්‍රදේශයේ පවතින ගැටළුකාරී තත්ත්වයන් සඳහා ආයතනික වශයෙන් දායකත්වයක් ,මැදිහත්වීමක් දැක්විය හැකි අවස්ථා වලදී ලොකු වෙනසක් ඇති කිරීමට හැකිවු බව පවසන ලදි. මේ දවස් වල රිලවුන්ගෙන් මහජනයා සඳහා කරදර සිදුවන අතර ඒ සඳහා කටයුතු සිදු කළයුතු ආයතන දැනුවත් කිරීමේදී රිලවුන් අල්ලන කූඩු ප්‍රමාණවත් නොවන බව පවසන ලදී. ඒ අනුව ආයතනය මැදිහත් වීමෙන් රිලවුන් අල්ලන කූඩු 02ක් සාදා දෙමින් එම ගැටළුව නිරිකරණය කර ගැනීමට කටයුතු කළ බව සඳහන් කරන ලදී.<br>තවදුරටත් ආයතන |
| | වාර්ෂික ගිණුම ඉදිරිපත් කිරීම | අවසන් ගිණුම සම්බන්ධයෙන් කළමනාකරණ විගණන වාර්තාවේදී පෙන්වා දී තිබූ මෙහෙයුම් අකාර්යක්ෂමතා හා කළමනාකරණ දුර්වලතා පිළිබඳව මීට පෙර පැවති කමිටුවේදී සාකච්ඡා කරන ලදී. එහිදි ලබා දෙන ලද තීරණ සඳහා අවදානය |

| | | |
|---|---|---|
| | | යොමු කර කටයුතු කරන අතර, ස්ථාවර වත්කමක් ලෙස දිස්ත්‍රික් පුස්තකාලය ඇතුළත් කිරීමට කටයුතු නොකළ ඇත්තේ 2013 වර්ෂයේදී ඒම ගොඩනැගිල්ල ඉදිකිරීමෙන් අනතුරුව අප ආයතනය වෙත පවරා දෙන ලෙස සඳහන් වුවත් මේවන තෙක් පවරා නොදීම හේතුවෙනි. එමෙන්ම වැලියාය පුස්තකාලය පවතින ඉඩමෙන් පර්චස් 100 ක භූමි ප්‍රමාණයක් ආයුර්වේදය සඳහා ලබා දීමට කටයුතු කරන ලදී. ඒ අනුව ස්ථාවර වත්කම් ලේඛණයෙන් එය ඉවත් කිරීමට කටයුතු සිදු කරන ලදී.- |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

## කාර්ය සාධනය පිළිබඳ සමාලෝචනය කිරීම හා රැස්වීම අවසන් කිරීම

අද දින පැවති මෙම විගණන හා කළමණාකරන කමිටුවේදී විශාල කරුණු රාශියක් සාකච්ඡා කරන ලදි. ඒ අනුව අද දින කමිටුවෙහි සාර්ථකත්වයක් ලබා ගැනීමට හැකිවු බවත්, මෙම විගණන හා කළමනාකරණ කමිටුව මඟින් පෙන්වා දී ඇති කරුණු කාරණා අනුව අඩුපාඩු හා දෝශ නිරාකරණය කර ගැනීමට හැකි වු බව සඳහන් කරන ලදි. අප වෙනුවෙන් පවුරක් ලෙස සිටින අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂතුමා ඇතුළු කාර්ය මණ්ඩලය, ජාතික විගණන අධිකාරීතුමිය ඇතුළු කාර්ය මණ්ඩලය සඳහා ආයතනය වෙනුවෙන් හා සභාපතිතුමා වෙනුවෙන් ගෞරවණීය ස්තූතිය පුදකරන ලදී.

| අනු අංකය | සාකච්ඡා කළ කරුණු | ගත් තීරණ | වගකීම |
| --- | --- | --- | --- |
| 01 | <u>අවසන් ගිණුමෙහි සම්පිණ්ඩන වාර්තාව පිළිබඳව සාකච්ඡා කිරීම</u><br><br>ගිණුම්ගත කරන දෝෂයන්<br><br>• ඉඩම් තක්සේරුව ද්විගණ වී ඇති බව සාකච්ඡා කරන ලදී. | ප්‍රාදේශීය සභාව සතු ඒකම ඉඩමෙහි ඇති ඉඩම හා දේපළ තක්සේරු කිරීමේදී ගොඩනැගිලි වල වෙනම තක්සේරුවක් කර ඇති නිසා ඒලෙස සිදුවී ඇති බව පවසන ලදී.<br>ඒහිදි දේපළ හා ඉඩම වෙන වෙනම තක්සේරු කළ යුතු බවත්, වර්ෂ අවසන් වීමෙන් අනතුරුව ඒම වෙනස් වීම් හා අළුතින් ඇතුළත් විය යුතු දේවල් අදාළ අවස්ථාවේදී ම ගිණුම් ගත කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදී. | විෂයභාර නිළධාරි, දෙපාර්තමේන්තුව |

| | |
|---|---|
| • පෙර වර්ෂයේ ඉදිකරනු ලැබූ තොඩනැගිලි 08 ක් ගිණුම් ගත නොකිරීම/ ආදාහනාගාරයේ ආදායම් වලින් රු.60000.00 ක මුදලක් පෙන්නුම් කර නොමැති බව | සභා අරමුදල් වලින් ඉදිකිරීම් නොකළත් පරිත්‍යාග ලෙස ගිණුම් ගත කිරිම අවශ්‍ය බවත්, මේ සඳහා පිළිතුරු සැපයීමේදී මෙම අඩුපාඩු ඉදිරි මුල්‍ය ප්‍රකාශන සකස් කිරිමේදී නිවැරදි කරන බව දැන්වීම නුසුදුසු බවත් පෙන්වා දී ඇති දෝෂයන් නිවැරදි කර ගත් බවත් දැන්වීම සුදුසු බවද පෙන්වා දෙන ලදී. |
| • නව බස්නැවතුම්පළෙ හි කඩකාමර 33න් 03ක් ගිවිසුම් ගත නොවීම පිළිබඳව සාකච්ඡාවට බඳුන් කිරීම | අඩු ආදායම්ලාභී තිදෙනෙකු සඳහා ලබාදී ඇති බව සර්ව සාධාරණීකරන වාර්තා මඟින් පෙන්නුම් කිරිමත්, විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමෙන් අනතුරුව ඒම පිළිතුර සඳහා විගණන දෙපාර්තමේන්තුව ඒකඟවන බවට ලිඛිතව වාර්තාවක් ලබා ගැනිම සුදුසු බව පෙන්වා දෙන ලදි. |
| | ඉන්වෙන්ට්‍රි ලේඛනය , භාණ්ඩ නිකුත් කරනු ලබන |

උපලේඛනයත් සමඟ ගැලපීම් සිදුවිය යුතුය. ඒසේ නොගැලපීමට හේතුව සොයා බලා නිවැරදි කර ගන්නා ලෙස දැනුම් දෙන ලදි.

- ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර ඇති සමහර භාණ්ඩයන් ඉන්වෙන්ට්‍රි ලේඛනයේ භාණ්ඩයන් සමඟ නොසැසදීම.

ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමෙන් අනතුරුව වසර 5 පසු සහතික නිකුත් කිරීමට නොහැකි බව පනතෙහි ඇත. අනුකූලතා සහතිකය ලබා නොගත් අය සඳහා මාස 06කට වරක් වත් ලිපි මඟින් ඒම සහතිකය ලබා ගන්නා ලෙස දැනුවත් කළ යුතු බවත්, මාස 03 කට වරක්වත් කෙෂ්ත්‍ර පරීක්ෂාවක් සිදුකිරිමත් ,විෂය නිලධාරීන් විසින් වර්තමාන තත්ත්වය සොයා බලා ලිපි නිකුත් කළ යුතු බවත් පෙන්වා දෙන ලදී.

- ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමෙන් අනතුරුව අදාල ඉදිකිරීම් පරීක්ෂා කර අනුකූලතා සහතික 200ක් නිකුත් නොකිරිම සම්බන්ධයෙන් සාකච්ඡා කිරිම.

- විගණන විමසුම් මඟින් ප්‍රාෙද්ශීය සභාව විසින් පවත්වා ෙගන

විදුලිබල මණ්ඩලය සමඟ විථි පහන් සම්බන්ධයෙන් ගිවිසුම් ගත වීම සුදුසු බව විගණන විමසුම් මඟින් විටින් විට දන්වා සිටින අතර ඒය ඒය අවාසිදායක තත්ත්වයක් බව පෙන්වීම හා පොදු මහජන

| | |
|---|---|
| යනු ලබන විථි අාෙලාක කරණය සඳහා විථි පහන් සවි කර අැති බවත් ඒ සඳහා විදුලි බල මණ්ඩලය සමඟ ගිවිසුම් ගත වී නොතිබීම සම්බන්ධව පෙන්වා දී ඇති කරුණු පිළිබඳව විමසීම. | අවශ්‍යතාවයන් සපුරාලිය යුතු බවත් දන්වා මේ සම්බන්ධයෙන් විසඳුමක් ලබා දෙන ලෙස සාධාරණීකරණ වාර්තාවක් දෙපාර්තමේන්තුව හරහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලෙස පෙන්වා දෙන ලදී. ඒමෙන්ම පලාත් විගණන හා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කර විසඳුමක් ලබා දෙන මෙන්ද සඳහන් කරන ලදි. |

- මෙම ඉඩම සඳහා ගෙවීමට සිදු වන බදු මුදල් වලින් නිදහස් වීමට අවශ්‍ය ඉල්ලීම් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට හා පරිසර අමාත්‍යාංශය වෙත මේ වන විට යොමු කර ඇති නිසා නැවත ඒ පිළිබඳව දැනුම් දීම් සිදු කිරිම සුදුසු බව සඳහන් කරන ලදි.

- මොනරාගල නව පොළ භූමිය ඉදිකිරිම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ

කොමිෂන් සභාව විසින්lrc ඒකඟතාවයක් ලබා දෙන ලදී. ඒ අනුව විදේශාධාර මත පොළහුමියේ ඉදිකිරීම් කටයුතු සිදු කරන ලදි. නමුත් දැනට මෙම ස්ථානයට අදාළව තක්සේරුවක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් බදු ගෙවීම සඳහා අප ආයතනය වෙතින් ඉල්ලා ඇති අතර, ඒම බදු වලින් නිදහස් කර ගැනීමට හැකියාවක් පවතීදැයි විමසන ලදි.

අධිභාර අය කර ගන්නා පාර්ශවයන් මේ වන විට ජීවතුන් අතර නොමැතී නිසා අය කර ගැනීමට නොහැකි වීම මත කඩ කුලී ලේඛන වලින් කපාහැරීම සඳහා දෙපාර්තමේන්තු මට්ටමින් ඉල්ලම් කළ යුතු බව පෙන්වා දෙන ලදි.

- ගව මස්කඩය සම්බන්ධයෙන් ගෙවීමට ඇති හිග මුදල් අය කර ගැනීම වෙනුවෙන් අධිභාර වශයෙන් ඒවකට සිටි සභාපති හා ලේකම් සඳහා ගෙවීමට නියම කර තිබුණද මේවන විට ඒම දෙපළම ජීවතුන් අතර නොමැති නිසා ඒ සම්බන්ධයෙන්

| | | | |
|---|---|---|---|
| | ක්‍රියාත්මක වීමේ ගැටළුවක් පවතින බව පෙන්වා දෙන ලදී. | | |
| 02 | ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කිරීම සම්බන්ධව<br><br>වර්තමානෙය් පවතින ඉන්ධන හිඟය හේතුවෙන් පොදු ප්‍රවාහන සේවා සීමා සහිත වීමත් සේවය සපයන බස් රථ සඳහා ද විශාල පිරිසක් පැමිණීම නිසා නගරයට 7 km 8km වඩා වැඩි දුරකින් සිටින සේවකයින් සඳහාද ප්‍රවාහන අපහසුතා මතුවී ඇති බවත්, | රාජකාරී ස්ථානයට පැමිණීම හා ඒයින් පිටවීමේ අනන්‍යතාවය ඇඟිලි සකුණු යන්ත්‍රයේ සටහන් කිරීම අනිවාර්යය බැවින් දෛනික රාජකාරියට බාධාවක් නොවන අයුරින් මෙම දුෂ්කර කාල සීමාව සඳහා සුදුසු ආකාරයෙන් සහන ලබාදීම සුදුසු බව දන්වා සිටින ලදී. | විෂයභාර නිළධාරි, දෙපාර්තමේන්තුව |

| | | |
|---|---|---|
| | ක්ෂේත්‍ර නිළධාරීන් සඳහා ලබා දී ඇති යතුරු පැදි සඳහා ඉන්ධන නොමැති කම නිසා නියමිත වේලාවට රාජකාරී ස්ථානයට වාර්තා කිරීමට නොහැකි බවත්, මෙම අපහසු කාල සීමාව තුලදී පැමිණිම හා පිටවිම සඳහා සහන යක් ලබා දෙන මෙන් ඉල්ලා සිටින ලදී. | |
| 03 | වාහන අළුත්වැඩියාවන් සිදු කිරීමේදී දෙපාර්තුමේන්තුව මඟින් අනුමත කර ගත යුතු සීමාවන් හා පළාත් යාන්ත්‍රික ඉංජිනේරුවරයාගෙන් ද අනුමත කර ගැනීමට අවශ්‍ය වුණත් වුවත් වර්තමාන වෙළෙඳපොළ් භාණ්ඩයන්හි මිල අධික ලෙස ඉහල යාම දක්නට ලැබෙන දෙයකි. ඒම නිසා සුළු අළුත්වැපියාවන් පවා අනුමත කිරීමට ඉදිරිපත් කිරීම ප්‍රායෝගික නොවන බව පෙනවා දෙමින් ඒ සඳහා ගත හැකි ක්‍රියාමාර්ග මොනවා දැයි විමසන ලදි. | දැනට තීරණය කර ඇති වියදම් සීමාවන් මහ සභා අනුමැතියක් ලබා ගැනීමෙන් අනතුරු ව දෙපාර්තමේන්තුවෙන් අනුමත කර ගැනීම සුදුසු බව සඳහන් කරන ලදි. |

| | | |
|---|---|---|
| 04 | වාහන අළුත්වැඩියා සිදු කිරීෙම්දි නිෙයා්ජිත අාගතනය මඟින් පළාත් පාලන අමාත්‍යාංශය මඟින් අනුමැතියක් ලබා ගැනීම අවශ්‍යය. නමුත් ෙමම අනුමැතිය ලැබීම ප්‍රමාද වීම් සිදු වන බැවින් නිසි ෙව්ලාවට අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට ෙනාහැකි බව පවසන ලදි.ඒ සඳහා විසදුමක් ලබා ෙදන ෙමන් ඉල්ලීම් කරන ලදී. | සභා අරමුදල් වලින් අළුත්වැඩියාවන් සඳහා වියදම් කරනු ලබන බැවින් අනුමත කරනු ලබන සීමාවන් ෙවනස් කිරීම් යටෙත් ද නිෙයා්ජිත අායතනය මඟින් නිකුත් කර අැති අැස්තෙම්න්තුෙවහි මිල සාධාරණීකරන කර ගැනීම අවශ්‍ය බැවින් ඒය අනුමත කර කඩිනමින් ආයතනය වෙත ලබා ගැනීම සඳහා පළාත් පාලන ෙදපාර්තෙම්න්තුව මඟින් උපදෙස් ලබා ගන්නා මෙන් දන්වා සිටින ලදී. |
| 05 | **රැකියා ලක්ෂයේ නිළධාරීන් නිවාඩු දිනයක් ලබා දීම**<br><br>වර්තමාන තත්ත්වය හමුවේ සතියකට දින ඒකක විවේකී දිනයක් ලබා දෙන ඉල්ලා ඇති අතර ,ඔවුන්ගේ පත්වීම් ලිපියේ සඳහන් කර ඇත්තේ සතියකට දින 2ක් වැඩ කළ යුතු බවයි. නමුත් ඔවුන්ගේ ඉල්ලීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ගය කුමක් දැයි විමසීම් කරන ලදී. | බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ඔවුන් සඳහා නිවාඩු දිනයක් ලබා දීම අනුමත කිරීමෙන් අනතුරුව රාජකාරීයට හානියක් පාඩුවක් සිදු නොවන පරිදි ලබා දීම සුදුසු බවයි. |

| | | |
|---|---|---|
| 06 | වාහන පිරිවැය වාර්තායක් පිළිසකර කර ගැනීම<br><br>ආයතනය සතු සියළුම වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා ලොග් සටහන් පොත හා සමානවම වාහන ඉතිහාසය හා වර්තමානයේ සිදු කරනු ලබන අළුත්වැඩියාවන් හා වාහනයේ තත්ත්වය පිළිබඳව සටහන් ඇතුලත් කරනු ලබන ලේඛණයක් සකස් කිරීමට පියවර ගන්නා මෙන් දන්වන ලදි. | මෙම ලේඛනය සකස් කර ගන්නා ලෙස දන්වන අතර ,ඊළඟ විගණන හා කළමනා කරණ කමිටු රැස්වීමේදී ඒහි ප්‍රගතිය බලන බවත්, ඉදිරියේදි විගණනය කිරීමේදීද මෙම වාර්තාව බලන බව සඳහන් කරන ලදී. |
| 07 | 2020 වර්ෂයේද | |

## ජාතික විගණන අධිකාරී කාර්යාලයේ විගණන අධිකාරී, ඒ.එම්.ආශා මධුමාලී හේමරත්න මියගේ අදහස් දැක්වීම

මොනරාගල ප්‍රාදේශීය සභාව විසින් අද දින විගණන හා කළමනාකරණ කමිටුව සඳහා ආරාධනා කිරීම සම්බන්ධව ප්‍රථමයෙන් ස්තූතිය පුද කර සිටින ලදී. අප විසින් විගණනය සිදු කරන අනෙකුත් ආයතන සමඟ බැලීමේදී මොනරාගල ප්‍රාදේශීය සභාව සමඟ කටයුතු කිරීමේදී හරිම සැහැල්ලුවෙන් රාජකාරි සිදු කිරීමට හැකි බව පවසන ලද අතර, එයට හේතුව වන්නේ නගර සභාවක මෙන් කාර්යයන් මෙම ප්‍රාදේශීය සභාවේ තිබුණත් සභා ලේකම්තුමා වන ඩී.එම්.අනුර දිසානායක විසින් පරිපාලන කටයුතු මනාව ඉටුකිරීම තුළයි. මෙහිදි ලේකම්තුමා වෙත ප්‍රශංසාවද පිරිනමන ලදි.

ජංගම වත්කම් යටතට ඇතුළත් කරනු ලබන්නේ අයවෙන ශේෂයන්ය. නමුත් බොරු වත්කමක් ලෙස දීර්ඝ කාලයක සිට අය නොවී පවතින ණයහිමි, ණය ගැති, සේවක ණය යනාදි ශේෂයන් දැක්වීම උචිත නොවන බව සඳහන් කරන ලදි.එහිදි සඳහන් කරන ලද්දේ අය කර ගැනීමට හැකි ශේෂයන් අයකර ගැනීමට කටයුතු කිරීමත්, අය කිරීමට නොහැකිව පවතින ශේෂයන් සඳහා ආයතනය විසින් ක්‍රියාමාර්ගයක් ගත යුතු බව පවසන ලදි.

පොදුවේ අායතන වල දක්නට ලැෙබන ගැටළු කිහිපයක් සම්බන්ධව අදහස් දක්වන ලදි.එනම් යම්කිසි ෙගවීමක් සම්බන්ධෙයන් වවුචර් ඉදිරිපත් කිරිෙම්දී ඊට අදාළ කැඳවීම් ලිපිය හෝ E-maill එකක් ලැබුණානම් එහි ප්‍රින්ට් එකක් ,ෆැක්ස් එකක් හෝ යනාදි ලිඛිත ලියවිල්ලක් ඇමිණිය යුතු බව සඳහන් කරන ලදි. තවද භාණ්ඩ සමික්ෂණ කටයුතු වලදී ගමන් වියදම් සඳහා දින 10ක් 15ක් වැනි ප්‍රමාණයක් ඇතුලත් කරත් ඒ සම්බන්ධයෙන් ද එම දිනයන් තුළදි ඉටු කර රාජකාරී ස්ථාන සම්බන්ධ සටහනක් හෝ අඩුම තරමින් සමික්ෂණ මණ්ඩලයට පත් කිරීම් ලිපිය හෝ අමුණා තිබිය යුතු බව සඳහන් කරන ලදි.

අධිභාර නිවේදන සම්බන්ධව ක්‍රියාත්මක වීම තුළ එම මුදල් අයකර ගැනීමත්, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම නිසා ඉදිරියට අධිභාර හිඟයන් නොපවතින බවත් වර්තමානයේ පවතින ආර්ථික තත්ත්වය හමුවේ අය කර ගැනීමට නොහැකි බවත් සඳහන් කරමින් ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳව ස්තූතිය ප්‍රකාශ කරන ලදි.

එමෙන්ම විපීපහන් සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනයක් පවත්වා ගැනීම කාලෝචිත බව ද සඳහන් කරන ලදි.

අවසන් ගිණුම පරික්ෂා කිරීමෙන් අනතුරුව ඉදිරිපත් කළ යුතු උත්තර කාල පමාවකින් තොරව ඉක්මනින් ලැබීමට සලස්වන මෙන් ඉල්ලා සිටිමින් එතුමියගේ අදහස් දැක්වීම අවසන් කරන ලදි.

## ඌව පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ_විමල් කරුණාතිලක මහතාගේ අදහස් දැක්වීම

ආයතනයක විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීම හා එහිදි ගනු ලබන තීන්දු තීරණ සඳහා නෛතික පදනමක් ලැබෙන බව එතුමා සඳහන් කරන ලදි. මෙම කමිටුවේදී ගනු ලැබූ තීරණයකට අනුව කටයුතු කිරීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් ගැටළුවක් පැන නැගුණ අවස්ථාවේදී මෙම කමිටුව හරහා තීරණ ලබා ගත් බව කිව හැකි බව ප්‍රකාශ කරන ලදි.

ජාතික විගණන පනත සමඟ මෙම කමිටුව පැවැත්වීම අනිවාර්යය වේ. මෙම කමිටුව තුළ සාකච්ඡා කරනු ලබන ගැටළු දෙපාර්තමේන්තු හරහා මහ භාණ්ඩාගාරය මඟින් පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු බවද සඳහන් කරන ලදි. ගිණුම් කාරක සභාව පළාත් මට්ටමින් පැවැත්වීමට කටයුතු යොදා ඇති බව ද සඳහන් කරන ලද අතර , ඒ සඳහා අදාළ විෂයයන්හි නිරත වන නිළධාරීන් දැනුවත්වී සූදානම් වන ලෙස ප්‍රකාශ කරන ලදි.

ගිණුම් හා විගණනය සම්බන්ධයෙන් කටයුතු කිරීමට අවස්ථාවක් ලැබීම මත ඔබ ආයතනය වෙනුවෙන් යමක් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව සතුටට පත් වන බව සඳහන් කරන ලදි. එමෙන්ම මොනරාගල ප්‍රාදේශීය සභාව අනෙකුත් ආයතන වලට සාපෙක්ෂව විගණනය සිදු කිරීමේදි දක්වන සහයෝගය වෙනුවෙන් ගෞරවණීය ස්තූතිය පුද කරන ලදි.

## කාර්ය සාධනය පිළිබඳ සමාලෝචනය කිරීම හා රැස්වීම අවසන් කිරීම

ආයතනය සතු කාර්යයන් නිවැරදිව ඉදිරියට පවත්වා ගෙන යාමේදී පාලනය කළ හැකි නොහැකි තත්ත්වයන් මත විනිවිධභාවකින් යුක්තව කටයුතු කිරීමට සිදු වන බව ප්‍රකාශ කරන ලදී.ඒ අනුව දෝශ හා ගැටළු පෙන්වා දෙමින් ඒ සඳහා අවශ්‍ය මඟ පෙන්වමින් පවුරක් මෙන් අප වටා සිටින අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂතුමා ඇතුළු කාර්ය මණ්ඩලයත්, ජාතික විගණන අධිකාරිතුමිය ඇතුළු කාර්ය මණ්ඩලයත්, පළාත් පාලන කොමසාරිස්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් ගෞරවනීය ස්තූතිය පුද කර සිටින ලදි. අප ආයතනය විගණනයට ලක්වීම ආශීර්වාදයක් කර ගත් නිසා ම ජයග්‍රහණ රාශියක් ලබා ගැනීමට හැකිවූ බව

පවසන ලදි. එමෙන්ම අද දින පැවැති මෙම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කරනු ලැබූ කරුණු කාරණා මැනවින් ධාරනය කර ගැනීමට හැකිවීම තුලින් නිළධාරීන් හට මනා පන්නරයක් ලැබුණු බවත් ,ඒ අනුව කටයුතු රාජකාරී කටයුතු සිදු කළ හැකි බවත් සඳහන් කරමින් පැමිණි සිටි සියළුම නිළධාරීන් ට ස්තූතිය පුද කරමින් කමිටුව අවසන් කරන ලදි.

රාජකාරී පැවරීම් මත ලිපි ෙගානු හා භාණ්ඩ භාරදීම ෙමා/ප්‍රා.ස/01/අ.වි

ෙමානරාගල ප්‍රාෙද්ශීය සභා ෙල්කම්ෙග් අංක හා දිනැති ලිපිය හා සම්බන්ධ ෙව්. ඒ අනුව විෂය අංක ෙමා/ප්‍රා.ස/01/අ.වි යටෙත් අැති පහත ලිපි ෙගානු හා භාණ්ඩ භාර ෙදන බව කාරුණිකව සඳහන් කරමි.

| අනු අංකය | ලිපි ෙගානුෙව් නම | ලිපි ෙගානු අංකය |
|---|---|---|
| 01 | විගණනහාකළමනාකරණකමිටු පිහිටුවීම | ෙමා/ප්‍රා.ස/02/09/වි/ක/කමිටු |
| 02 | චක්‍රලේඛ ගොනුව | මො/ප්‍රාස/01/අ.වි/01 |
| 03 | විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම | මො/ප්‍රාස/01/අ.වි/01/04/03-2020 |
| 04 | අභ්‍යන්තර විගණන වාර්තාව | මො/ප්‍රාස/01/අ.වි/01/03-2020 |
| 05 | අභ්‍යන්තර විගණන සැලැස්ම 2020 | |